# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 10 ශ්‍රේණිය
## ගැනුම් ජර්නලය, විකුණුම් ජර්නලය හා පොදු ජර්නලය

1. ව්‍යාපාරයක ගැනුම් ජර්නලයේ වාර්තා කරනු ලබන්නේ කුමන ගනුදෙනුද?

   (1) අත්පිට මිලදී ගැනුම්
   (2) ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස ණයට ගැනුම්
   (3) නැවත විකිණීමේ පරමාර්ථ සහිත සියලු මිලට ගැනුම්
   (4) නැවත විකිණීමේ පරමාර්ථ සහිත ණයට ගත් වෙළෙඳ භාණ්ඩ

2. ගැනුම් ජර්නලයේදී යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ,

   (1) හරපත  (2) බැරපත
   (3) ගැනුම් ඉන්වොයිසිය  (4) විකුණුම් ඉන්වොයිසිය

3. හිරිපිටිය ස්ටෝර්ස් ණයටගත් භාණ්ඩ පිළිබඳව පහත තොරතුරු ඔබට දී ඇත.

| දිනය | අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2021/03/01 | 071 | ඇසළ | 65 000 |
| 2021/3/10 | 078 | නිකිණි | 13 000 |
| 2021/3/20 | 037 | බිනර | 21 000 |
| 2021/3/30 | 070 | රමා | 11 000 |

   අවශ්‍ය වන්නේ,
   (1) ඉහත ගනුදෙනු ගැනුම් ජර්නලයක වාර්තා කිරීම.
   (2) අදාළ ලෙජර් ගිණුම්වල වාර්තා කිරීම.

4. ගැනුම් ජර්නලයක එකතුව ලෙජරයට පිටපත් කිරීමේ ජ'නල් සටහන කුමක්ද?

   (1) ණයහිමියෝ හර ගැනුම් ගිණුම බැර
   (2) විකුණුම් ගිණුම හර අදාළ ණයහිමියෝ බැර
   (3) ගැනුම් ගිණුම හර අදාළ ණයහිමියෝ බැර
   (4) ගැනුම් ගිණුම හර අදාළ ණයගැතියෝ බැර

5. ව්‍යාපාරයක විකුණුම් ජර්නලයක වාර්තා කරනු ලබන ගනුදෙනු වර්ගය කුමක්ද?

   (1) අත්පිට විකුණුම් හා ණයට විකුණුම්
   (2) සියලු ණයට විකුණුම්
   (3) ණයට විකුණුම් කළ වෙළෙඳ භාණ්ඩ
   (4) අත්පිට විකුණුම් පමණි.

6. විකුණුම් ජර්නලයක ගනුදෙනු වාර්තා කිරීමේදී ඔබ යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය කුමක්ද?

   (1) බැරපත
   (2) හරපත
   (3) ගැනුම් ඉන්වොයිසිය
   (4) විකුණුම් ඉන්වොයිසිය

7. වැල්ලව ස්ටෝර්ස් ණයට විකුණුම් සිදුකළ ගනුදෙනු කිහිපයක් පහත දක්වා ඇත.

| දිනය | අංකය | ගැනුම්කරු | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2021.07.01 | 98 | අමල් ව්‍යාපාරය | 27 000 |
| 2021.07.10 | 99 | වාසනා ව්‍යාපාරිකයෝ | 64 000 |
| 2021.07.16 | 100 | නාමල් ස්ටෝර්ස් | 81 000 |
| 2021.07.22 | 101 | තරංග සහ පුත්‍රයෝ | 53 000 |
| 2021.07.30 | 102 | උදය ට්‍රේඩින් | 15 000 |

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු ඇසුරෙන් 2021 ජුලි මාසය සඳහා විකුණුම් ජර්නලය පිළියෙල කර ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

8. ව්‍යාපාරයක විකුණුම් ජර්නලයේ එකතුව ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීමේ ජර්නල් සටහන කුමක්ද?
   (1) ණයගැතියෝ හර විකුණුම් ගිණුම බැර
   (2) විකුණුම් ගිණුම හර ණයගැතියෝ බැර
   (3) මුදල් ගිණුම හර ණයගැතියෝ බැර
   (4) මුදල් ගිණුම හර විකුණුම් ගිණුම බැර

9. ගනේවත්ත ව්‍යාපාරිකයෝ පහත තොරතුරු ඔබට සපයා ඇත.

   I. 2021.07.01 උයන්ගල්ල ස්ටෝර්ස් වෙතින් අංක 288 යටතේ ණයට ගැනුම් එකක් රු. 200 බැගින් කවකටු පෙට්ටි 50 (අඩුකළ යුතු වෙළෙඳ වට්ටම් 10%)

   II. 2021.07.06 අලුත්ගම ව්‍යාපාරයට ණයට විකුණුම් අංක 50 යටතේ එකක් රු.500 බැගින් වූ ඡායා පිටපත් කඩදාසි පැකට් 40 (අඩුකළ යුතු වට්ටම් 5%)

   III. 2021.07.13 කැකුලාවල සමාගම වෙත ණයට විකුණුම් අංක 51 යටතේ පෙට්ටි එකක් රු.300 බැගින් වූ බෝල්පොයින්ට් පෑන් පෙට්ටි 30 (අඩුකළ යුතු වට්ටම් 15%)

   IV. 2021.07.20 මහවැලි ව්‍යාපාරය වෙතින් අංක 301 යටතේ ණයට ගැණුම් එකක් රු. 800 බැගින් බිත්ති ඔරලෝසු 20 (අඩුකළ යුතු වට්ටම් 20%)

   V. 2021.07.25 අංක 100 යටතේ ගෝනගම ට්‍රේඩින් වෙතින් ණයට ගැනුම් බන්ඩල් එකක් රු. 300 බැගින් ෆයිල් කවර බන්ඩල් 60 (අඩුකළ යුතු වට්ටම් 25%)

   VI. 2021.07.30 මෙදින අංක 52 යටතේ තල්විට ස්ටෝර්ස් වෙත ණයට විකුණුම් එකක් රු.250 බැගින් වතුර බෝතල් 20 (අඩුකළ යුතු වට්ටම් 5%)

   අවශ්‍ය වන්නේ,
   (1) ගැනුම් ජර්නලය හා විකුණුම් ජර්නලය
   (2) අදාළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම

10. ව්‍යාපාරයක පොදු ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනු වර්ගය කුමක් විය හැකිද?

   (1) ව්‍යාපාරයේ ප්‍රයෝජනයට අත්පිට මිලදීගත් භාණ්ඩ
   (2) වෙනත් උපයෝගී පොත්වල සටහන් නොවන ඕනෑම ගනුදෙනුවක්
   (3) නැවත විකිණීම පිණිස අත්පිට ගන්නා ලද වෙළෙඳ භාණ්ඩ
   (4) ව්‍යාපාරයේ අයිතිකරු සම්බන්ධ ගනුදෙනු

11. ව්‍යාපාරයක පොදු ජර්නලය පහත දැක්වේ.

පොදු ජර්නලය

| දිනය | වවුචර් අංකය | විස්තරය | ලෙ.පි. | හර රු. | බැර රු. |
|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) |

මෙහි 1 – 6 දක්වා නම් කරන්න.

12. පොදු ජර්නලයක සටහන් කරනු ලබන ගනුදෙනු සඳහා උදාහරණ තුනක් නම් කරන්න.

13. පහත ගනුදෙනු පොදු ජර්නලයක වාර්තා කරන්න.

(1) 2021.07.01 දින වවුචර් අංක 200 යටතේ ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා උදානි සමාගමෙන් ණයට ගත් ලී බඩු රු. 50 000

(2) 2021.07.10 දින වවුචර් අංක 500 යටතේ පෞද්ගලික ප්‍රයෝජනය පිණිස අයිතිකරු ලබා ගත් භාණ්ඩ තොගය රු.20 000කි.

14. කුසල්ගේ ව්‍යාපාරය තුළ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ. මෙම ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය නම් කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| 1. උයන්ගල්ල ස්ටෝර්ස් වෙත ණයට විකුණුම් රු. 50 000 | .......................................... |
| 2. අඹගස්වැව ව්‍යාපාරයේ ණයට ගැනුම් රු. 40 000 | .......................................... |
| 3. අත්පිට විකුණුම් මුදල් ලැබීම් රු. 30 000 | .......................................... |
| 4. ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ණයට ගත් ලීබඩු රු. 80 000 | .......................................... |

15. ඉහත ගනුදෙනු වාර්තා කිරීමේ මූලික පොත් නම් කරන්න.

(1) ............................

(2) ............................

(3) ............................

(4) ............................

16. කපුහේන ව්‍යාපාරය පහත තොරතුරු ඔබට දී ඇත.

ගැනුම් ජර්නලය

| දිනය | ඉන්. අංකය | සැපයුම්කරු | වටිනාකම රු. | මුළු වටිනාකම(රු) |
|---|---|---|---|---|
| 7/2 | 0718 | අනුර | 50 000 | |
| 7/10 | 0610 | රංජිත් | 35 000 | |
| 7/30 | 0783 | චමින්ද | 1)...................... | 100 000 |
| | | | | 100 000 |

විකුණුම් ජර්නලය

| දිනය | ඉන්. අංකය | සැපයුම්කරු | වටිනාකම රු. | මුළු වටිනාකම(රු.) |
|---|---|---|---|---|
| 7/5 | 0712 | සමන් | 2)...................... | |
| 7/15 | 0713 | චාමර | 26 000 | |
| 7/25 | 0714 | සුපුන් | 19 000 | 70 000 |
| | | | | 70 000 |

අවශ්‍ය වන්නේ,

(1) අදාළ හිස්තැන් සම්පූර්ණ කරන්න.

(2) අදාළ ලෙජර් ගිණුම් පෙන්වන්න.

17. විකුණුම් ජර්නලය යනු,

1. ලෙජර් ගිණුමකි
2. මූලික සටහන් පොතකි
3. මූල්‍ය ප්‍රකාශනයකි
4. පුද්ගල ගිණුමකි

18. නෙළුම් පොකුණ ව්‍යාපාරය පාන් රාත්තල් 20 ක් නැවත විකිණීම පිණිස ඕලු ව්‍යාපාරයෙන් ණයට ලබා ගනී. මෙය වාර්තා කළ යුත්තේ,

1. මුදල් ගිණුමේ
2. ගැනුම් ජර්නලය
3. විකුණුම් ජර්නලයේ
4. පොදු ජර්නලය

19. මකුල්වැව ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට දී ඇත.

| දිනය | ඉන්. අංකය | ගැනුම්කරු | ප්‍රමාණය | වෙනත් |
|---|---|---|---|---|
| 2021.03.10 | 99 | අමාලි | එකක් රු. 1500 බැගින් ටී ෂර්ට් 200 | වෙළෙඳ වට්ටම් 10% |
| 2021.03.20 | 100 | සුවිමාලි | එකක් රු. 800 බැගින් කොට කලිසම් 50 | වෙළෙඳ වට්ටම් 20% |
| 2021.03.30 | 101 | නිමාලි | එකක් රු.1000 බැගින් ගවුම් 20 | වෙළෙඳ වට්ටම් 5% |

අවශ්‍ය වන්නේ,

1. විකුණුම් ජර්නලය
2. අදාළ ලෙජර් ගිණුම්

20. පහත සඳහන් ඡේදයේ හිස්තැනට සුදුසු ගිණුම්කරණ පදය යොදන්න.

2021.03.01 දින ව්‍යාපාරයක් ආරම්භකළ නාදන් ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස අහමඩ් සමාගමෙන් රු. 100 000 ක ලීබඩු උපකරණ ණයට ගෙන ඇත. මෙය ①..............................වාර්තා කළ යුතු අතර, ඒ සඳහා මූලාශ්‍ර ලේඛන ② .............................. වේ. නැවත විකිණීම සඳහා රු. 50 000 ක වෙළෙඳ භාණ්ඩ මාලන් සමාගමෙන් ණයට ගත් අතර, එය ③.............................. ඇතුළත් කල යුතු අතර මේ සඳහා මූලාශ්‍ර ලේඛනය④.............................. වේ. නාදන් විසින් රු. 80 000 ක භාණ්ඩ නඩරාජ් සමාගමට ණයට විකුණු අතර එය ⑤.............................. වාර්තා කළ අතර මූලාශ්‍ර ලේඛනය ලෙස ⑥.............................. යොදාගෙන ඇත.